## පළමුවැනි පරිශිෂ්ටය

(අ) 1960 ලංකා පාර්ලිමේන්තුව විසින් පනවන ලද ප්‍රධාන නීති.

(ආ) 1960 දී මුදල් මණ්ඩලය විසින් සකස් කර ගන්නා ලද ප්‍රධාන පාලන විධිවිධාන.

# අ—1960 දී ලංකා පාර්ලිමේන්තුව විසින් පනවන ලද ප්‍රධාන නීති

## 1960 අංක 6 දරන විසර්ජන පනත

1960–61 මුදල් වර්ෂයේ වියදම් සඳහා ද, එවැනි වියදම් සඳහා ලංකාව තුලින් හෝ පිටතින් ණය ලබා ගැනීමට බලය පැවරීමට ද, එම මුදල් වර්ෂය තුළ ආණ්ඩුවේ යම් යම් කාර්යයන් සඳහා මුදල් වෙන් කිරීම ද, එම මුදල් වර්ෂය තුල එවැනි කාර්යයන් සඳහා ගෙවීමට අවශ්‍ය වන මුදල් ඒකාබද්ධ අරමුදලින් අත්තිකාරම් වශයෙන් ලබා ගැනීමට ද, එවැනි මුදල් ඒකාබද්ධ අරමුදලට ආපසු ගෙවීමට ඉඩ සැලසීමට ද එකී කරුණුවලට අමතරව හෝ ඊට සම්බන්ධිත කරුණුවලට ඉඩ සැලසීමට ද යෙදෙන පනතෙකි.

අනුමත කළ දිනය–1960 දෙසැම්බර් 20

වර්තමාන පාර්ලිමේන්තුවට රැස් වූ ලංකාවේ උත්තර මන්ත්‍රී මණ්ඩලයේ සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ අනුශාසනය හා අනුමැතිය අනුව හා ඇතිව එහිම බලය ප්‍රකාර අත්‍යුත්තම ප්‍රතාපවත් මහා රාජිණිය විසින් මෙසේ පනවනු ලැබේ.

**කෙටි නාමය**

1. මේ පනත 1960 අංක 6 දරණ විසර්ජන පනත යනුවෙන් හැඳින්වෙයි.

**1960-61 මුදල් වර්ෂය සඳහා විසර්ජනය**

2. (i) යම් වියදමක් සඳහා බලය පවරන වෙනත් කුමන නීතියකට හෝ හානියක් නොවන පරිද්දෙන්, 1960 ඔක්තෝබර් 1 වැනිදයින් පටන්ගෙන 1961 සැප්තැම්බර් 30 වැනිද අවසන් මුදල් වර්ෂයේ වියදම් සඳහා තක්සේරු කර ඇති රුපියල් එකසිය අසූ හතර කෝටි තිස් පන් ලක්ෂ පනස් නවදස් අටසිය පණස් හතරක වියදම;

(අ) ලංකාවේ ඒකාබද්ධ අරමුදලේ හෝ වෙනත් අරමුදලක හෝ ආණ්ඩුවේ හෝ සුදුස්සක් කිරීම සඳහා ආණ්ඩුව වෙත තිබෙන හෝ මුදලින් ගෙවීමට මෙයින් බලය පවරන ගෙවීම්වලින්; හා

(ආ) ලංකාව තුලින් හෝ පිටතින් හෝ මුළු ප්‍රමාණය රුපියල් හතළිස් හත් කෝටියකට නො වැඩිව ලංකාණ්ඩුව වෙනුවෙන් ලබා ගැනීමට මෙයින් බලය පවරන ණයවලින්; ලබා ගත යුතුය.

මෙහි මීත් පෙර සඳහන් කළ රුපියල් එකසිය අසූ හතර කෝටි තිස් පන් ලක්ෂ පණස් නව දස් අටසිය පණස් හතරක වියදම මේ පනතෙහි පළමු ලේඛනයෙහි නියමිත පරිදි වැය කළ යුතුය.

(ii) මේ වගන්තියේ 1 වැනි උප වගන්තියේ විධිවිධානයන්ගෙන් හෝ වෙනත් කුමන ලිඛිත නීතියක් යටතේ හෝ ලංකාණ්ඩුව සඳහා හෝ වෙනුවෙන් ණය ලබා ගැනීමට බලය පවරන විධිවිධානයන්ට හානියක් නො විය යුතුයි.

**1960-61 මුදල් වර්ෂය සඳහා වූ ආණ්ඩුවේ යම් යම් කාර්යයන් සම්බන්ධව මුදල් වෙන් කිරීම.**

3. (i) 2 වැනි වගන්තියේ සඳහන් මුදල් වර්ෂය තුල වූ මෙම පනතේ දෙවැනි උප ලේඛනයෙහි 1 වැනි තීරුවෙහි නියමිත එක් එක් කාර්යයන්ගෙන් ආණ්ඩුවේ ලැබීම්, එවැනි කාර්යයන් ගණනට බැර කළ යුතුය ; නමුත් එසේ බැර කරන එවැනි මුළු ලැබීම් ප්‍රමාණය එම උප ලේඛනයේ iii වැනි තීරුවෙහි අනුරූප සටහනෙහි නියමිත උපරිම සීමාව නො ඉක්මවිය යුතුය. එවැනි උපරිම සීමාවට වැඩි වන එවැනි කාර්යයන්ගෙන් ලැබීම, ලංකා ඒකාබද්ධ අරමුදලට බැරකළ යුතුය.

(ii) මේ පනතේ 2 වැනි උප ලේඛනයෙහි පළමු වැනි තීරුවෙහි නියමිත එක් එක් කාර්යයන් සඳහා 2 වැනි වගන්තියේ සඳහන් කෙරෙන, මුදල් වර්ෂය තුල දී ආණ්ඩුව විසින් දරන ලද වියදම්, එම මුදල් අවුරුද්දේ දී, එකී කාර්යයන්ගෙන් ලැබීම්වලින් ගෙවිය යුතුය. එහෙත් එම වියදම් එම උපලේඛනයේ ii වැනි තීරුවේ අනුරූප සටහනෙහි නියමිත උපරිම සීමාවට වැඩි නො විය යුතුයි.

(iii) 2 වැනි වගන්තියේ මුදල් වර්ෂය අවසානයේ දී, මේ පනතේ 2 වැනි උප ලේඛනයේ 1 වැනි තීරුවේ නියමිත යම් කාර්යයක් සඳහා වූ නොබේරු බැර ශේෂය එම උප ලේඛනයේ 4 වැනි තීරුවෙහි අනුරූප සටහනෙහි නියමිත උපරිම සීමාවට වැඩි නොවිය යුතුය. එසේම එම මුදල් වර්ෂය අවසානයේ දී එම කාර්යයන්හි මුළු වගකීම, එම උප ලේඛනයෙහි 5 වැනි තීරුවෙහි අනුරූප සටහනෙහි නියමිත උපරිම සීමාවට නො වැඩි විය යුතුයි.

**1960-61 මුදල් වර්ෂය තුළ, 3 වැනි වගන්තියේ සඳහන් කාර්යයන් සඳහා අත්තිකාරම් ඒකාබද්ධ අරමුදලින් ලබා ගැනීම සහ නැවත එකී අරමුදලට ගෙවීම.**

4. 2 වැනි වගන්තියේ සඳහන් මුදල් වර්ෂයේ කුමන අවස්ථාවක දී හෝ මේ පනතෙහි දෙ වැනි උප ලේඛනයෙහි 1 වැනි තීරුවෙහි ඕනෑම කාර්යයකින් ආණ්ඩුවේ ලැබීම්, එම

කාර්යය සඳහා ආණ්ඩුව විසින් දරන වියදම් සඳහා ප්‍රමාණවත් නොවන්නේ නම්, එවැනි විය දම් සඳහා මුදල් ඇමති විසින් හඟින ප්‍රමාණයක් ලංකාවේ ඒකාබද්ධ අරමුදලින් අත්ති කාරමක් වශයෙන් ලබා ගෙන ගෙවීමට අවශ්‍ය යැයි ආඥාවකින් විධානය කරනු ඇත. එසේ වුව ද, එසේ ලබා ගන්නා අත්තිකාරම් ප්‍රමාණය එම උප ලේඛනයේ 11 වැනි තීරුවෙහි නියමිත අනුරූප සටහනෙහි නියමිත උපරිම ප්‍රමාණයට නො වැඩි විය යුතුයි. එසේ ලබා ගන්නා යම් මුදලක් මුදල් ඇමති විසින් ආඥාවකින් විධාන කරන පරිදි ඒකාබද්ධ අරමුදලට නැවත ගෙවිය යුතුය.

**එකම් වැය ශීර්ෂයක් යටතේ වූ එක සමාන වැය මුදලක වියදම් නො කළ මුදල් තවත් සීමිත වැය මුදලකට පැවරීම.**

5. මේ පණතේ පළමු උප ලේඛනයේ විධි විධාන නිසාවෙන්, එම ලේඛනයේ නිය මිත කුමන ශීර්ෂයක් යටතේ හෝ දක්වෙන අංක, 3, 5 සහ 7 යන ශීර්ෂවලට හැර වෙන කුමන වැය ශීර්ෂයක් සඳහා හෝ වෙන් කළ එහෙත් වියදම් නො කළ හෝ වියදම් නො කෙරිනැයි සැලකෙන යම් මුදල්, භාණ්ඩාගාරයේ ලේකම් හෝ ඔහු විසින් බලය පවරන ලද වෙනත් නිලධාරියෙකුගේ ආඥාවක් අනුව එම ශීර්ෂය යටතේ වූ වෙන වැය මුදලකට බැර කළ හැකිය.

**මෙම පනතේ 2 වැනි උප ලේඛනයේ නියමිත උපරිම සීමාවන් වෙනස් කිරීමට මුදල් ඇමති වරයාට ඇති බලය.**

6. මුදල් ඇමතිවරයාට ආණ්ඩුවේ අනුමැතිය ඇතුව, මේ පනතේ දෙවැනි උප ලේඛනයේ ii වැනි තීරුව, iii වැනි තීරුව, iv වැනි තීරුව හෝ v වැනි තීරුවෙහි නියමිත උපරිම සීමාවන් වෙනස් කළ හැකිය.

**මෙම පනතෙහි බලය යටතේ යම් වියදම් දරන ලද බව හා අත්තිකාරම් දෙන ලද බව සැලකීම හා මෙම පනතේ පළමුවැනි උප ලේඛනයට යම් යම් මුදල් ඇතුලත් කිරීම.**

7. 1960 ඔක්තෝබර් 1 වැනිදයින් පටන් ගෙන 1960 සැප්තැම්බර් විසි අට වැනි දින නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් සම්මත කර ගත් මේ පනත පටන් ගන්නා දිනයට එක්බිතිවම පෙරාතුව දිනයේ අවසන් වන කාලය තුල වියදම් සඳහා මූල්‍ය විධිවිධාන සැලසීමේ යෝජනාවෙහි කෙසේ සඳහන් වුව ද, එම යෝජනාවෙන් වෙන් කළ මුදලින්,

(අ) එම යෝජනාවේ පළමු වැනි උප ලේඛනයේ නියමිත ශීර්ෂයන් යටතේ, යම් වැය මුදලක් සඳහාම යම් මුදලක් එම කාලය තුල දී වැය කොට තිබේ නම්, එය සෑම කරුණක් සඳහාම මේ පනතේ බලය යටතේ වැය කරනු ලැබූ වක් සේ සලකනු මිස එම යෝජනාව යටතේ වැය කළ ලෙස නො සැලකිය යුතුයි.

(ආ) එසේ වෙන් කළ මුදලක්, මේ පනත පටන් ගැනීමට එක්බිතිවම පෙරාතුව වූ දිනයේ වැය නො කොට තිබූ මුදල් සෑම කරුණක් සඳහාම එම සමාන ශීර්ෂයෙහි සමාන වැය මුදලට වෙන් කළ මුදල්වලට ඇතුලත් සේ සැලකිය යුතුයි.

(ඇ) එම යෝජනාවෙහි දෙ වැනි උප ලේඛනයෙහි නියමිත වියදම් සඳහා ඒකාබද්ධ අරමුදලින් අත්තිකාරම් වශයෙන් එම කාලය තුල දී ගෙවා ඇති මුදල්, සෑම කරුණක් සඳහාම මේ පනතේ බලය යටතේ අත්තිකාරම් දුන්නාක් ලෙස සලකනු මිස, එම යෝජනාව යටතේ අත්තිකාරම් දීමක් ලෙස නො සැලකිය යුතුයි.

## සටහන—1960 විසර්ජන පනත

1960 ට පෙර පැවති සිරිත වූයේ ණය අරමුදල් වියදම් සඳහා අවශ්‍ය මුදල් ප්‍රමාණය ඒකාබද්ධ අරමුදලින් ගෙවීම් සඳහා විසර්ජන පනත්වලින් බලය දීමය. ඕනෑම ලිඛිත නීතියක් යටතේ ගනු ලබන ණයකින්, මෙකී අත්තිකාරම් ඒකාබද්ධ අරමුදලට ආපසු නො ගෙවනු ලැබුයේ නම්, අවුරුද්දකට පසුව, එකී අත්තිකාරම මුදලෙන් නොබේරා ඇති මුදල් වර්ෂයක වියදම් සඳහා ගෙවිය යුතු කුමන මුදලකට හෝ අතිරේකව ඒකාබද්ධ අරමුදලින් අයකර ගැනීමට පනත් යටතේ ඉඩ සලසා තිබිණ. 1960 දී මේ ක්‍රමය අත් හැර 1960–61 මුදල් වර්ෂය සඳහා තක්සේරු කළ වියදම (අ) ඒකාබද්ධ අරමුදලින් හෝ වෙනත් ආණ්ඩුවේ අරමුදල්වලින් ගෙවීමට සහ (ආ) මුළු ණය ප්‍රමාණය රුපියල් 47 කෝටි යකට වැඩි නො වන මෙරටින් හෝ පිටතින් ලබා ගන්නා ණයවලින් හෝ ගෙවීමට, 1960 විසර්ජන පනතින් බලය දී ඇත. අළුත් ක්‍රමය යටතේ, වර්තන වියදම් හා ප්‍රාග් ධන වියදම් වර්තන ආදයමින් හා වර්ෂය තුල ලබා ගන්නා ණයවලින් ලබා ගනු ලැබේ.

පනතේ නවාංගයක් වනුයේ නොයෙක් වර්ගවලට බෙදී ගිය ආණ්ඩුවේ කාර්ය යන් පුළුල් වශයෙන් පරිපාලනය, සමාජ සේවා හා ආර්ථික සංවර්ධන යනුවෙන් කොටස් තුනකට බෙදීමය.

## අ ා—1960 දී මුදල් මණ්ඩලය විසින් සකස් කර ගන්නා ලද ප්‍රධාන පාලන විධිවිධාන

(i) චක්‍ර ලේඛ අංක 9.

1960 අගෝස්තු 12 වැනි දින,
ශ්‍රී ලංකා මහ බැංකුව,
කොළඹ.

### ණය සඳහා මහ බැංකු පොළිය

(මුදල් නීති පනතේ 82 සහ 86 වැනි වගන්ති සම්බන්ධවයි.)

1. 1960 අගෝස්තු 13 වැනිද සිට රජයේ ණයපත් ඇපකොට වෙළෙඳ බැංකු විසින් මහ බැංකුවෙන් ලබා ගන්නා ණය සඳහා පොළිය වර්ෂයකට සියයට 4 ක් විය යුතුය.

2. 1960 අගෝස්තු 13 වැනිද සිට පහත දක්වෙන ගනුදෙනු සඳහා භාවිතීය පොරොන්දු නෝට්ටු ඇප කොට වෙළෙඳ බැංකු විසින් මහ බැංකුවෙන් ලබා ගන්නා ණය සඳහා පොළිය සියයට 2 1/2 ක් විය යුතුය.

(අ) ආහාර, රෙදිපිළි, කපුනූල් ඖෂධ ද්‍රව්‍ය, පෝර හා කෘෂිකාර්මික උපකරණ මෙරටට ගෙන්වීම, ලංකාව ඇතුළත ඒ ද්‍රව්‍ය මිලට ගැනීම, ගබඩා කිරීම හා පරිවහණය සඳහා දෙනු ලබන ණය.

(ආ) ලංකාව ඇතුළත කෘෂිකාර්මික, සත්ව, ඛනිජ හෝ කාර්මික නිෂ්පාදනය හා සම්පාදනයට මුදල් යෙදීම සඳහා දෙනු ලබන ණය.

(ඇ) මෙරට භාණ්ඩ හා නිෂ්පාදන ද්‍රව්‍ය ලංකාව ඇතුළත මිල දී ගැනීම, ගබඩා කිරීම හෝ පරිවහණයට මුදල් යෙදීම සඳහා දෙනු ලබන ණය.

3. 1958 දෙසැම්බර් 16 වැනි දින අංක 8 දරන චක්‍ර ලේඛය ද, 1959 දෙසැම්බර් 24 වැනි දින අංක 4 දරන චක්‍ර ලේඛය ද මෙයින් අවලංගු කරනු ලැබේ.

4. ඔවුන්ගේ භාවිතීය පොරොන්දු නෝට්ටු මහ බැංකුව වෙත ඇප වශයෙන් තබන ගනුදෙනුකාරයන්ට දෙ වැනි ඡේදයෙහි නියමිත අඩු පොළී පහසුකම් ලබා දිය යුතුය.

එස්. ඩී. අමරසිංහ,
ප්‍රධාන ගණකාධිකාරි,
ශ්‍රී ලංකා මහ බැංකුව.

ඩී. ඩබ්ලිව්. රාජපතිරාන,
අධිපති,
ශ්‍රී ලංකා මහ බැංකුව.

(ii) චක්‍ර ලේඛ අංක 10

1960 අගෝස්තු 12 වැනි දින,
ශ්‍රී ලංකා මහ බැංකුව,
කොළඹ.

## ණය දීම් සඳහා වෙළෙඳ බැංකු පොලිය

(මුදල් නීති පනතේ 103 වැනි වගන්තිය සම්බන්ධවයි.)

1960 අගෝස්තු 13 වැනිද සිට ණය දීම් සඳහා වෙළෙඳ බැංකුවලට අය කළ හැකි උපරිම පොළී ප්‍රමාණයන් 1960 අගෝස්තු 12 වැනිද බලපැවැත්වූ පොළී ප්‍රමාණයන් අනුව තිබිය යුතු අතර, කවර අන්දමකින්වත් එය වර්ෂයකට සියේට 6 කට වැඩි නො විය යුතුයි.

(අ) භාණ්ඩ හා නිෂ්පාදිත (ආයාත හැර) මිල දී ගැනීමට හෝ ගබඩා කිරීමට හෝ එවැනි භාණ්ඩ සහ නිෂ්පාදිත ලංකාව ඇතුලත පරිවහණය කිරීම සඳහා ණය දීම්.

(ආ) කෘෂිකාර්මික, සත්ව, ඛනිජ හා කාර්මික නිෂ්පාදිත ලංකාවේ සෑදීම, නිෂ්පාදනය හා සකස් කිරීමට මුදල් යෙදීම සඳහා ණය දීම්.

(ඇ) පහත දක්වෙන ආයාත මෙරටට ගෙන්වීමට, මිල දී ගැනීමට, විකිණීමට, පරිවහණය කිරීමට හෝ ගබඩා කිරීමට ණය දීම්:—

ආහාර
රෙදිපිළි
කපු නූල්
ඖෂධ ද්‍රව්‍ය
පෝර සහ
කෘෂිකාර්මික උපකරණ

එස්. ඩී. අමරසිංහ,
ප්‍රධාන ගණකාධිකාරී,
ශ්‍රී ලංකා මහ බැංකුව.

ඩී. ඩබ්ලිව්. රාජපතිරාන,
අධිපති,
ශ්‍රී ලංකා මහ බැංකුව.

(iii) චක්‍ර ලේඛ අංක 11

1960 අගෝස්තු 12 වැනි දින,
ශ්‍රී ලංකා මහ බැංකුව,
කොළඹ.

## වෙළෙඳ බැංකු ණය

ලංකාවේ විදේශීය වත්කම් පසුගිය වසර කීපය තුල සිට පිරිහෙමින් පවතින නිසා, අත්‍යාවශ්‍ය වුවමනාවන් සඳහා හැකිතාක් දුරට මෙරට විදේශීය මුදල් ඉතිරිකර ගැනීමේ අභිලාෂයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් මුදල් නීති පනතේ, 5 වැනි පරිච්ඡේදයේ 7 වැනි කොටසේ නියමයන් යටතේ, මුදල් විධිවිධානයන් යොද ගැනීමට තීරණය කොට තිබේ.

2. මේ විධිවිධාන—

(අ) ආයාත සඳහා ණයවර ලිපි ලබා ගැනීමේ අවම සීමිත අවශ්‍යතා සපුරා ලිය යුතු යැයි උදක් ඉල්ලීමෙන්

(ආ) බැංකු ණය ප්‍රසාරණය සීමා කිරීමෙන්

සමහර භාණ්ඩ ගෙන්වීම අධෛර්යමත් කරනු සඳහා, සකස් වී ඇත.

3. මීට අනුරූපව වෙළෙඳ බැංකු විසින් පිළිපැදීම සඳහා පහත දැක්වෙන නියෝග මුදල් මණ්ඩලය විසින් සකස් කොට තිබේ.

### (අ) ණයවර ලිපි සඳහා වූ අවම සීමිත අවශ්‍යතා

1960 අගෝස්තු 13 වැනිද සිට, මෙහි මීට අමුණා ඇති (අ) උප ලේඛනයෙහි විස්තර කොට ඇති භාණ්ඩ සඳහා නියමිත ප්‍රමාණයට අවම සීමිත අවශ්‍යතා මුදල් ණය වර ලිපිය අරඹන බැංකුවෙහි එම අරඹන වේලාවේ දී තැන්පත් කරතොත් මිස, එකී භාණ්ඩ ගෙන්වීම සඳහා වෙළෙඳ බැංකු විසින් ණයවර ලිපි නො ඇරඹිය යුතුය.

උප ලේඛනයෙහි විස්තර කොට ඇති භාණ්ඩ ගෙන්වීම සඳහා දැනට අරඹා ඇති ණයවර ලිපි සම්බන්ධව, ඉහත පරිච්ඡේදයෙහි සඳහන් කර ඇති නියමයනට අනුකූලව මිස, එකී ණයවර ලිපිවල වටිනාකම වැඩි කිරීමට, වෙළෙඳ බැංකු විසින් අවසර නොදිය යුතුය.

ඉහත නියමයන් අනුව, තැන්පත් කිරීමට අවශ්‍ය අවම සීමිත අවශ්‍යතා මුදල් ලබා ගැනීමට කිසිම ණයක් හෝ ණය හෝ වෙළෙඳ බැංකු විසින් නො දෙන ලෙස මහ බැංකුව ඉල්ලා සිටී.

### (ආ) වෙළෙඳ බැංකු විසින් දෙනු ලබන ණය සීමා කිරීම

1. 1960 අගෝස්තු 13 වැනිද සිට, පහත දැක්වෙන නියමිත කරුණු සඳහා එනම්, "අ" උප ලේඛනයෙහි විස්තර කර ඇති, කිසිම භාණ්ඩයක්, ලංකාව තුලට ගෙන්වීම සඳහා මේ චක්‍ර ලේඛය නිකුත් කරන දිනට දී ඇති ණය ප්‍රමාණය වෙළෙඳ බැංකු විසින් වැඩි නො කළ යුතුයි.

ඉහත නියමිත කරුණු සඳහා සලසා ඇති අයිරා පහසුකම් ඒවා නිමාවන තුරු එසේම පැවැතිය යුතුයි.

2. 1960 අගෝස්තු 13 වැනිද සිට මේ සමග අමුණා ඇති "අ" උප ලේඛනයෙහි විස්තර කර ඇති භාණ්ඩ කුලී පිට ගැනුම් කටයුතුවලට වෙළෙඳ බැංකු විසින් ණය දිය යුත්තේ එවැනි භාණ්ඩ කුලී පිට ගැනීමෙන් ඇතිකර ගත් ගිවිසුම් ඇප වශයෙන් ඔබ පනයක්, උකසක්, තබා ගැනීමේ අයිතියක්, පැවැරීමක් හෝ යටත් කොට බැඳතැබීමෙක් ලබා ගැනීමෙන් පසුව පමණෙකි. එවැනි ගිවිසුම් යටතේ දෙන බැංකු ණය කුලී පිට ගන්නන් විසින්, ගිවිසුම් අනුව අයිතිකරුවනට ගෙවිය යුතු මුදලින් සියයට 33 1/3 ක් හෝ භාණ්ඩවල වටිනාකමින් සියයට 25 ක් හෝ යන මෙයින් අඩු ගණනට නො වැඩි විය යුතුයි.

ඉහත සඳහන් කරුණු සඳහා එවැනි කුලී පිට ගිවිසුම් ඇපයට තබා ගෙන අයිරා පහසුකම් සැලසූ විට, එවැනි පහසුකම් ඉහත නියමිත අවම සීමිත අවශ්‍යතාවලට වැඩි නො වීමට, ගනුදෙනුකරුවන් සමග පිළියෙළ කර ගන්නා ලෙස බැංකුවලින් ඉල්ලා සිටිනු ලැබේ. එසේ කිරීමේ දී ගනුදෙනුකරුවන්ගේ නොබේරා ඇති චෙක්පත් ද බැංකු විසින් සැලකිල්ලට ගත යුතුය.

3. 1960 අගෝස්තු 13 වැනි ද සිට වෙළෙඳ බැංකු විසින් පහත නියමිත කරුණු සඳහා එනම්, මේ සමග අමුණා ඇති "ආ" උප ලේඛනයේ සඳහන් කෙරෙන භාණ්ඩ සඳහා දෙනු ලබන ණය ප්‍රමාණය වැඩි නො කළ යුතුය.

**එස්. ඩී. අමරසිංහ,**
ප්‍රධාන ගණකාධිකාරී,
ශ්‍රී ලංකා මහ බැංකුව.

**ඩී. ඩබ්ලිව්. රාජපතිරාන,**
අධිපති,
ශ්‍රී ලංකා මහ බැංකුව.

## "අ" උප ලේඛනය

| ලංකා රේගු වාතීා සංග්‍රහයේ සම්බන්ධතා අංකය | භාණ්ඩ | සීමිත අවශ්‍යතා |
|---|---|---|
| 716–12 | වායු සමන උපකරණ .. .. .. .. | 50% |
| 112 | බීර, ඒල්, ස්ටවුට්, පෝටර් හා ධාන්‍යවලින් පෙරන වෙනත් බීම හැර මද්‍යපාන .. .. .. .. | 50% |
| 657 | බිම ඇතිරිලි හා සැරසිලි තිර .. .. .. .. | 50% |
| 899–16·01 | පවුන්ටන් පෑන් (තල හැර) අනිකුත් කොටස් .. .. | 50% |
| 821 | ගෘහ භාණ්ඩ හා සවිකරණ උපකරණ .. .. .. | 50% |
| 732–01 | මෝටර් කාර් හා ස්ටේෂන් වැගන් .. .. .. | 50% |
| 641 | කඩදසි හා කඩදසි බෝඩ් .. .. .. .. | 50% |
| 552 | සුවඳ විලෙවුන්, සබන් හා පිරිසිදු කරන හා ඔප දමන ද්‍රව්‍ය .. | 50% |
| 861–02 | ඡායාරූප හා සිනමා ඡායාරූප ද්‍රව්‍ය හා උපකරණ .. .. | 50% |
| 862 | ඡායාරූප හා සිනමා භාණ්ඩ .. .. .. .. | 50% |
| 863 | අනාවෘත මිලි මීටර් 35 සිනමා චිත්‍ර පටි .. .. .. | 50% |
| 864 | ඔරලෝසු .. .. .. .. .. | 50% |
| 92101 | අශ්වයන් .. .. .. .. .. | 50% |

## "ආ" උප ලේඛනය

### භාණ්ඩ

මෙරටට ගෙන්වන–වායු සමන උපකරණ

,, ගෘහ භාණ්ඩ හා සවිකරන දේ

,, මෝටර් රථ හා ස්ටේෂන් වැගන්

,, ඡායාරූප හා සිනමා ඡායාරූප ද්‍රව්‍ය හා උපකරණ

,, අනාවෘත මිලි මීටර් 35 සිනමා චිත්‍ර පටි

## (iv) 1960-8-13 වැනි දින සහ අංක 12,184 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙන් උපුටා ගන්නා ලදී.

මුදල් නීති පනත

1949 අංක 58 දරන මුදල් නීති පනතේ 10 (සී) හා 93 වැනි වගන්ති යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් පනවන ලද **නියෝගයයි.**

**ඩී. ඩබ්ලිව්. රාජපත්‍රිරාන,**
අධිපති.

1960 අගෝස්තු 12 වැනි දින,
කොළඹ දී ය.

### නියෝගය

1950 දෙසැම්බර් 15 වැනි දින අංක 10,190 දරන ගැසට් නිවේදනයෙන් හා 1953 සැප්තැම්බර් 11 වැනි දින අංක 10,588 දරන ගැසට් නිවේදනයෙන් සංශොධිත 1950 අගෝස්තු 28 වැනි දින අංක 10,143 දරන ගැසට් පත්‍රයේ පළ වූ, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් පනවන ලද ''ඩී'' නියෝගය ''සියයට දහය'' යන වචන වෙනුවට ''සියයට දෙළහ'' යන වචන යොදා මෙයින් තවදුරටත් සංශොධනය කරනු ලැබේ.

(v) චක්‍ර ලේඛ අංක 9/1.

1960 අගෝස්තු 27,
ශ්‍රී ලංකා මහ බැංකුව,
කොළඹ 1.

## ණය සඳහා මහ බැංකු පොළිය

1960 අගෝස්තු 12 වැනි දින අංක 9 දරන චක්‍ර ලේඛය සම්බන්ධවයි.

අංක 9 දරන චක්‍ර ලේඛයේ 2(අ) ඡෙදයේ "කෘෂිකාර්මික උපකරණ" යන වචන ඉවත් කොට ඒ වෙනුවට "කෘෂිකාර්මික හා කාර්මික උපකරණ හා යන්ත්‍රොපකරණ හා ඊට අවශ්‍ය අමතර කොටස්" යන වචන යෙදීමෙන්, අද සිට වලංගු වන පරිදි, මෙයින් සංශොධනය කරනු ලැබේ.

**එස්. ජී. අමරසිංහ,**
ප්‍රධාන ගණකාධිකාරි,
ශ්‍රී ලංකා මහ බැංකුව.

**ඩී. ඩබ්ලිව්. රාජපත්‍රිරාන**
අධිපති,
ශ්‍රී ලංකා මහ බැංකුව.

**(vi) චක්‍ර ලේඛ අංක 10/1**

1960 අගෝස්තු 27 වැනි දින,
ශ්‍රී ලංකා මහ බැංකුව,
කොළඹ 1.

## ණය සඳහා වෙළෙඳ බැංකු පොලිය

1960 අගෝස්තු 12 වැනි දින සහ අංක 10 දරන චක්‍ර ලේඛය සම්බන්ධවයි.

අංක 10 දරන චක්‍ර ලේඛයේ, ''කෘෂිකාර්මික උපකරණ'' යන වචන වෙනුවට ''කෘෂි කාර්මික හා කාර්මික උපකරණ, යන්ත්‍රෝපකරණ හා ඊට අවශ්‍ය අමතර කොටස්'' යන වචන යෙදීමෙන්, අද සිට වලංගු වන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.

එස්. ඩී. අමරසිංහ,
ප්‍රධාන ගණකාධිකාරි,
ශ්‍රී ලංකා මහ බැංකුව.

ඩී. ඩබ්ලිව්. රාජපත්‍රිරාන,
අධිපති,
ශ්‍රී ලංකා මහ බැංකුව.

(vii) චක්‍ර ලේඛ අංක 11/1

1960 අගෝස්තු 27 වැනි දින,
ශ්‍රී ලංකා මහ බැංකුව,
කොළඹ 1.

## වෙළෙඳ බැංකු ණය

1960 අගෝස්තු 12 වැනි දින සහ අංක 11 දරන අපගේ චක්‍ර ලේඛය සම්බන්ධවයි.

1960 අගෝස්තු 12 වැනි දින සහ අංක 11 දරන චක්‍ර ලේඛයේ ''අ'' උප ලේඛයේ දැක්වෙන ''කඩදාසි සහ කඩදාසි බෝඩ්'' යන ශීර්ෂය අද පටන් ඉවත් කරන ලෙස වෙළෙඳ බැංකුවලින් ඉල්ලා සිටිනු ලැබේ.

එස්. ඩී. අමරසිංහ,
ප්‍රධාන ගණකාධිකාරි,
ශ්‍රී ලංකා මහ බැංකුව.

ඩී. ඩබ්ලිව්. රාජපත්‍රිරාන,
අධිපති.
ශ්‍රී ලංකා මහ බැංකුව.

(viii) චක්‍ර ලේඛ අංක 11/2

1960 නොවැම්බර් 7 වැනි දින,
ශ්‍රී ලංකා මහ බැංකුව,
තැ. පෙ. 590,
කොළඹ 1.

## වෙළෙඳ බැංකු ණය

1960 අගෝස්තු 12 වැනි දින අංක 11 දරන අපගේ චක්‍ර ලේඛයේ "අ" උප ලේඛයෙන් නියමිත භාණ්ඩ මෙ රටට ගෙන්වන්නන්ට 1960 නොවැම්බර් 8 වැනි දින සිට එකී භාණ්ඩ ලබා ගැනීම සඳහා භාර කුවිතාන්සි පිට ලියකියවිලි මුදලීමේ දී සැලසිය යුතු උපරිම පහසුකම් එකී භාණ්ඩවල රක්ෂණ හා නැව් කුලී සහිත මිලෙන් සියයට 25 කට නො වැඩි විය යුතුය.

**එස්. බී. අමරසිංහ**
ප්‍රධාන ගණකාධිකාරි,
ශ්‍රී ලංකා මහ බැංකුව.

**ඩබ්ලිව්. තෙන්නකෝන්,**
නියෝජ්‍ය අධිපති,
ශ්‍රී ලංකා මහ බැංකුව.,

## (ix) එක්සත් ජනපදයේ ඩොලර් සඳහා මහ බැංකුවේ විනිමය ගාස්තු

| දිනය | චක්‍රලේඛ අංකය | | මිලයට ගැනීම් (ඩොලර් 100 කට) | විකිණීම් (ඩොලර් 100 කට) |
|---|---|---|---|---|
| 5. 1.60 | 1/127 | එතැන්<br>ඉදිරි තෙමස දක්වා | රු. 474·75<br>මසකට සත 25ක් එතැන් මිලෙන් වට්ටම් කොට | රු. 475·00<br>රු. 475·00 |
| 18. 1.60 | 1/128 | එතැන්<br>ඉදිරි තෙමස දක්වා | රු. 475·25<br>මසකට සත 25ක් එතැන් මිලෙන් වට්ටම් කොට | රු. 475·50<br>රු. 475·50 |
| 25. 1.60 | 1/129 | එතැන්<br>ඉදිරි තෙමස දක්වා | රු. 474·75<br>මසකට සත 25ක් එතැන් මිලෙන් වට්ටම් කොට | රු. 475·00<br>රු. 475·00 |
| 8. 2.60 | 1/130 | එතැන්<br>ඉදිරි තෙමස දක්වා | රු. 474·50<br>රු. 474·50 | රු. 474·75<br>මසකට සත 25ක අධික මිලක් එතැන් මිලට එකතුව |
| 17. 2.60 | 1/131 | එතැන්<br>ඉදිරි තෙමස දක්වා | රු. 474·25<br>රු. 474·25 | රු. 474·50<br>මසකට සත 25ක අධික මිලක් එතැන් මිලට එකතුව |
| 8. 4.60 | 1/132 | එතැන්<br>ඉදිරි තෙමස දක්වා | රු. 473·85<br>රු. 473·85 | රු. 474·10<br>මසකට සත 25ක අධික මිලක් එතැන් මිලට එකතුව |
| 29. 4.60 | 1/133 | එතැන්<br>ඉදිරි තෙමස දක්වා | රු. 474·00<br>රු. 474·00 | රු. 474·25<br>මසකට සත 25ක අධික මිලක් එතැන් මිලට එකතුව |
| 13. 5.60 | 1/134 | එතැන්<br>ඉදිරි තෙමස දක්වා | රු. 474·25<br>රු. 474·25 | රු. 474·50<br>මසකට සත 25ක අධික මිලක් එතැන් මිලට එකතුව |
| 18. 5.60 | 1/135 | එතැන්<br>ඉදිරි තෙමස දක්වා | රු. 474·75<br>රු. 474·75 | රු. 475·00<br>මසකට සත 25ක අධික මිලක් එතැන් මිලට එකතුව |
| 1. 6.60 | 1/136 | එතැන්<br>ඉදිරි තෙමස දක්වා | රු. 475·25<br>රු. 475·25 | රු. 475·50<br>මසකට සත 25ක අධික මිලක් එතැන් මිලට එකතුව |
| 3. 6.60 | 1/137 | එතැන්<br>ඉදිරි තෙමස දක්වා | රු. 475·75<br>රු. 475·75 | රු. 476·00<br>මසකට සත 25ක අධික මිලක් එතැන් මිලට එකතුව |
| 14. 6.60 | 1/138 | එතැන්<br>ඉදිරි තෙමස දක්වා | රු. 475·50<br>රු. 475·50 | රු. 475·75<br>මසකට සත 25ක අධික මිලක් එතැන් මිලට එකතුව |
| 24. 6.60 | 1/139 | එතැන්<br>ඉදිරි තෙමස දක්වා | රු. 475·00<br>රු. 475·00 | රු. 475·25<br>මසකට සත 25ක අධික මිලක් එතැන් මිලට එකතුව |
| 5. 7.60 | 1/140 | එතැන්<br>ඉදිරි තෙමස දක්වා | රු. 474·75<br>රු. 474·75 | රු. 475·00<br>මසකට සත 25ක අධික මිලක් එතැන් මිලට එකතුව |
| 5. 8.60 | 1/141 | එතැන්<br>ඉදිරි තෙමස දක්වා | රු. 474·50<br>රු. 474·50 | රු. 474·75<br>මසකට සත 25ක අධික මිලක් එතැන් මිලට එකතුව |
| 12. 8.60 | 1/142 | එතැන්<br>ඉදිරි තෙමස දක්වා | රු. 474·25<br>රු. 474·25 | රු. 474·50<br>මසකට සත 25ක අධික මිලක් එතැන් මිලට එකතුව |

| දිනය | චක්‍රලේඛ අංකය | | මිලයට ගැනීම (ඩොලර් 100 කට) | විකිණීම (ඩොලර් 100 කට) |
|---|---|---|---|---|
| 14. 9.60 | 1/143 | එතැන්<br>ඉදිරි තෙමස දක්වා | රු. 474·00<br>රු. 474·00 | රු. 474·25<br>මසකට සත 25ක අධික මිලක් එතැන් මිලට එකතුව |
| 19. 9.60 | 1/144 | එතැන්<br>ඉදිරි තෙමස දක්වා | රු. 473·85<br>රු. 473·85 | රු. 474·10<br>මසකට සත 25ක අධික මිලක් එතැන් මිලට එකතුව |
| 27. 9.60 | 1/145 | එතැන්<br>ඉදිරි තෙමස දක්වා | රු. 474·50<br>රු. 474·50 | රු. 474·75<br>මසකට සත 25ක අධික මිලක් එතැන් මිලට එකතුව |
| 3.10.60 | 1/146 | එතැන්<br>ඉදිරි තෙමස දක්වා | රු. 474·00<br>රු. 474·00 | රු. 474·25<br>මසකට සත 25ක අධික මිලක් එතැන් මිලට එකතුව |
| 6.10.60 | 1/147 | එතැන්<br>ඉදිරි තෙමස දක්වා | රු. 474·25<br>රු. 474·25 | රු. 474·50<br>මසකට සත 25ක අධික මිලක් එතැන් මිලට එකතුව |
| 13.10.60 | 1/148 | එතැන්<br>ඉදිරි තෙමස දක්වා | රු. 474·50<br>රු. 474·50 | රු. 474·75<br>මසකට සත 25ක අධික මිලක් එතැන් මිලට එකතුව |
| 24.10.60 | 1/149 | එතැන්<br>ඉදිරි තෙමස දක්වා | රු. 474·00<br>රු. 474·00 | රු. 474·25<br>මසකට සත 25ක අධික මිලක් එතැන් මිලට එකතුව |
| 1.11.60 | 1/150 | එතැන්<br>ඉදිරි තෙමස දක්වා | රු. 473·85<br>රු. 473·85 | රු. 474·10<br>මසකට සත 25ක අධික මිලක් එතැන් මිලට එකතුව |
| 2.12.60 | 1/151 | එතැන්<br>ඉදිරි තෙමස දක්වා | රු. 474·00<br>රු. 474·00 | රු. 474·25<br>මසකට සත 25ක අධික මිලක් එතැන් මිලට එකතුව |
| 14.12.60 | 1/152 | එතැන්<br>ඉදිරි තෙමස දක්වා | රු. 474·50<br>රු. 474·50 | රු. 474·75<br>මසකට සත 25ක අධික මිලක් එතැන් මිලට එකතුව |